නඩරාජා ඝාතනයෙන් පසු

පසුගිය සති කිහිපය තුළත් ලංකාවේ බොහෝ විපරීයාස සිදුවූ බව තවදුරටත් දන්නා කාරණයක්. එල්.ටී.ටී.ය මමුදාව අතර උතුරු නැගෙනහිර ඇවිලෙන සටන් සාමාන්‍ය සිද්ධීන් බවට පත්වෙලා. ඒ සටන් වලින් සාමාන්‍ය අහිංසක මිනිසුන් මරෙන එක උනුහුන්න බැරි බේදාවාසයක්.

කොව් සංවිධානයට හිතවත්ව කරගැනු කළ ජෝසෆ් පරාජසිංහම් නැගෙනහිරදී ඝාතනය වුවාට පසු රියේ පෙරේදා නාදුනන තුවක්කුකරුවෙක් අතින් මිය ගිය නඩරාජා රවිරාජ් ගැනත් මෙතිදී වචනයක් සඳහන් කරන්න ඕන. නඩරාජා කරපු කථා වලින් ඔහු කිසි දිනෙක කොව් සංවිධානය විවේචනය නොකරන්න පරෙස්සම් වුණා. ඔහු හැම කථාවක්ම කළේ වාසිය ඔවුන්ට දීලයි. හමුත් නඩරාජා කොළඹ ඉඳන් සැඩ්ඩිව සිංහලෙන් හෝ ජනතාව අමතමින් යාපනේ සිට කොළඹට අළුත් පාලමක් දැම්මා. යාපනේ ජනතාවගේ දුක් ගැනවිලි රටේ පාලකයන් පවා දැනගන්නේ නඩරාජා ගෙන්. නඩරාජාගේ සිංහල කථාකිරීම අසාන්ත සිංහල මිනිස්සුන් උනන්දුවක් දැක්වුවා. ඔහු සිංහලයන්ට විපක්ෂව සිංහලෙන් කථා කළත් සිංහල ජනතාවට විරුද්ධව වචන කළේ නැහැ.

> හමුත් නඩරාජා කොළඹ ඉඳන් සැඩ්ඩිව සිංහලෙන් හෝ ජනතාව අමතමින් යාපනේ සිට කොළඹට අළුත් පාලමක් දැම්මා. යාපනේ ජනතාවගේ දුක් ගැනවිලි රටේ පාලකයන් පවා දැනගන්නේ නඩරාජා ගෙන්.

ඔහු ප්‍රජාතන්ත්‍රවාදීව පාර්ලිමේන්තුව හරහා කොළඹ සිට යාපනය දක්වා දේපොළකය කළා. එල්.ටී.ටී.යේ අතකොළුවක් බවට පත්වූ ඔහුට, එල්.ටී.ටී.යට අතකමැති වුණත් කැමති බව පෙන්නන්න සිද්ධ වුයේ ජීවිතයට ඇති ආශාව නිසයි. කොළඹට වෙලා බය හැකිව ඔහු දේශපාලනය කළේ ප්‍රභාකරන්ට වඩා සිංහල ජනතාව විශ්වාස නිසයි. දෙමළ ජනතාවගේ ප්‍රශ්ණ වලට ප්‍රජාතන්ත්‍රවාදීව අපි අදහසිකන් දෙන බව ලෝකයට දැනගන්න නඩරාජලා නොදැ පතුරක් වුණා. මේ මරණය කවුරුන් කළාද යන්න තවමත් දැන ගැනීමට බැරි වුණත් ලෝකයා මේ තුළින් අප දෙස බලන්නේ වපර ඇතිනි. ඒකෙ වැඩි වාසිය ලැබෙන්නේ ප්‍රභාකරන්ට. දෙමළ ජනතාවටත්, අපිටත් වාද විවාද කරමින් ප්‍රජාතන්ත්‍රවාදීව දේපොළකය කළ හැකි බව ලෝකයාට පෙන්නන්න නඩරාජා වැනි මිනිසුන් අපි ආරක්ෂා කරගත යුතුයි. නඩරාජාගේ මරණය සිදුවූ දින රාත්‍රියේ පාළුවූ තම පියාගේ දේහය අසලා සිට අදෙන් දියණිය කදිම කථාවක් කියල තිබුණා. -මැරෙණයින් පස්සෙ තවුරුත් ඇවිල්ලා පයක්ක් දෙකක් ඉඳලා ශෝකය කියල යයි, ඒත් අන්තිමේදි තාත්තා නැති ලොකුම පාඩුව සිද්ධ වුණේ අපිට තමයි." ඒ ඔහුගේ දියණිය වැළපෙමින් කියූ වදන් වැලක්.

ඒ වගේම සරත් පොන්සේකා ගෙන් පස්සෙ ගෝඨාභය ජීවිතය බේරා ගන්නෙ අනුනවයෙන්. ලෝකයේ ජීවත් වන කාලකණ්ණිම මිනිසා තමයි තවත් ජීවිත නසාගෙන මරාගෙන මරෙන එකා. ඒකෙන් උදා අතිව වැඩකුත් නැහැ, ලැබෙන දේකුත් නැහැ. මිනිස් අත්මයක් ලබන්නට පින් කර අතිව එවැනි කාලකණ්ණි මිනිසුන්ගම ජීවිතය ලබා ගත නොහැකි වස්තූන් වලට දන් දෙන්නේ බොධිසත්ව කුකුළන්ගත් වඩා අන්ත විදියට. දෙමළ ජනතාව රිකෙන් රිකන වදු කරන ප්‍රභාකරන් මුළු ලොවේ සෑම පනයාටම පිළිලියන් වෙලා. හැංගි වාහන කටිටක් හප්පා මරාගෙන මැරිම ඊරකමක් ලෙස ප්‍රභාකරන් සැළකුවත්, එය බියගුළු ක්‍රියාවක් බව ලෝකයම පිළි අරන් ඉවරයි. කෙතරම් මරාගෙන මරෙන්නත් ප්‍රභාකරන් ලබා ගත්තේ කුමක්ද?

හමුවේ ලොක්කන් අනු නවයෙන් දිවි බේරා ගැනීමත් ප්‍රභාකරන්ට ලොකු අවාසියක්. මරණ හය යන්නම් හෝ දැනිච්ච මිනිහා ඊට පස්සෙ හැම ගැටයක්ම ගහන්නෙ සතුරාගෙන් බේරි ජීවත් වෙන්න, එහෙත් එවැනි ලොකු මිනිසුන්ගේ ජීවිත බේරම ගැන සතුරාගේ සතුටටත් කතා කළත් එම මිනිසුන් ආරක්ෂා කරමින් වගේ යන අහිංසක හමුදාවේ කොල්ලන් ගැන කවුරුත් වැඩිය කතා නොකිරීමත් දුකට උනන්දුවක් තියෙනවා. ඔවුන්ගේ ජීවිත බිඳිච්ච ගැන දුක්වෙන පුමාණය අඩුයි. ඒ පිළිබඳව සියන්න තියෙන්නේ නඩරාජාගේ ළුව කියපු ටිකම තමයි.

මේවා ඔක්කොම මැදින් තවත් විශේෂ සිදුවීමක් ලංකාවේ සිදුවා වුණා. ඒ, ජනාධිපති තුමාගේ පුත්‍රයෙක් නාවික හමුදාවට සම්බන්ධ වීම. ඔහු සාමාන්‍ය පරිදි සම්මුඛ පරීක්ෂණයට ගොස් කැබෙට් ගිලධාරියෙක් වදියට හමුදාවට බඳඳුණා. ලොක්කන්ගේ පුත්තු පිරරරවල කොට මගින්දගෙ දරුවන් හොඳ ආදර්ශයක්. කොට මගින්දගෙ දරුවන් හොඳ ආදර්ශයක්. රත්වත්තගෙ, එස්. බීගෙ පුත්තු එක්ක බඳන කොට මගින්දගෙ දරුවන් හොඳ ආදර්ශයක්. ඇඩු තරමින් මේවිරට අහිංසක දෙමළ කොල්ලන්, කෙල්ලන් බඳි දෙන ප්‍රභාකරන්ටත් බැරි වුණා , තම දරුවෙක් කොටි සංවිධානයට බඳවාගෙන දෙමළ ජනතාවට ඒ ආදර්ශය දෙන්න.

සමහරු හමි කියනවා ඔක කළේ බොරුවට ලෝකට පේන්නයි. ඒකත් හමුදාවට තව තව කොල්ලො බන්ලා ගන්නයි කියලා. හමුත් අපේ රටේ කිසිම නායකයෙකුටත් බොරුවටවත් එහෙම දෙයක් කරන්න බැරිව ගියා. මේ සියල්ල දැඩිත් ජාතක කථා සංග්‍රහයේ එන 'තාම සිද්ධි ජාතකයෙන්' අපිට වැදගත් පණිවඩයක් දෙනවා. ඒ - කෙනෙකු වැදගත්- නොවැදගත්හෝ යහපත් - අයහපත් වන්නේ ඔහුගේ නාමය, තනතුරු අනුව නොව, ඔහු කරන කටයුතු අනුවය" යන කාරණයයි.

රමණි ලියනාරච්චි

ඔබේ මුහුණේ
සැඟිලා දුවුවේ සිනහව පමණි
හමුවන හැම්වේට
කතා කළේ
අන් අයගේ යහපතට
යමන් කළ හැකි ද යන්නයි
මෙහි වෙසෙන
ලාංකිකයන් වෙනුවෙන්
ඔබ කළ සේවය
පුන පුනා කිව යුතු වේ ද
අද ඔබ අප අතර නැති හමුදු
මතකය පමණක් ඉතිරිව ඇත
ඒ සොඳුරු මතකයන්
සැඟිලා අලුත් වෙයි
ඔබ අපෙන් වෙන් වුණත්
ඔබේ ගුණ සුවඳ
සැඟිලා අප හදවත් තුළ
රැව් පිළිරැව්දෙනු ඇත
මේ සසර ගමනේ දී
නැවතා ඔබ අප අතර ඉපදේවා
රමණි අක්කේ

ශ්‍රීනාත් මද්දුමගේ

දුටු තැන දෑත් අල්ලා "මල්ලියේ" යි කියා හිනැහුණා ඔබ පිළිබඳ මතකය හිබඳ අප හදවත් තුළ රැඳෙනු ඇති බව නිසැක ය. හොඳ යමක් දුටු තැන හො-පැකිළි එය පසසන්නට ඔබ ඉදිරිපත් වූ අවස්ථා කොපමණ ද ? සෙනෙහුගේ දස්කමක් අගය කරන්නට හිත් හමා ගත නොහැකි කුහක ම්නිසුන් පිරි සමාජයට ඔබ ආදර්ශයක් වීය. රමණි අක්කේ ඔබට හිවන් සුව

ජගත් පේ එදිරිසිංහ
සන්නස කණ්ඩායම වෙනුවෙන්

අධිනීතිඥ චන්ද්‍රා වීරකෝන්

මා පළමු වරට මෙල්බන් නුවර වේදිකාවක ගීයක් ගැයූ දා ඔබ කළ ප්‍රශංසාව කිසිදා අමතක කොවේ. කෙනෙකුගේ හොඳ කියන්නට ඇකැමැති මිනිසුන් හැසැරුණුත් පිරි සමාජයක සුවඳවත් ප්‍රෙජයක් වූ ඔබට මගේ අවංක ආචාරය මෙයේ පුද කරමි.

ශ්‍රීපාලි එදිරිසිංහ

හමුවුණා මුල් දිනයේ සිට අවසන් වරට හමුවූ දින දක්-වාම නොවෙසස් සෙනෙහසකින් අප අසුරු කළ රමණි ලියනාරච්චි මහත්මිය වැනි හොඳ පුද්ගලයින් අපට මේ සමාජයේ හමුවන්නේ හරිම කලාතුරකින්.

දිනෙල්කා දර්ශණී

රමණි මට මුලින් හමුවුණේ මෙයට වසර 27 කට පෙර මීයුසියස් විද්‍යාලයේ ගුරු මණ්ඩලයේ අප එක් සේවය කළ අවදියේ දීයි. ගුරු කාමරයේ පැත්තක වාඩි වී බොහෝ වීට අප සිංහල සංගීතය ආදී ඕඩ දේ ගැන රසවත් සාකච්ඡා කොතෙක-ත් කළ හිටි මා මතකයට නැඟෙනවා. ඛනනයට මෙන්ම ගායනයට ලේශේ හැකියාවක් දැක්වූ රමණි සතුව තිබූ අපූර්වතම දක්ෂකම වූයේ ඕනෑම සිංහල ගීතයක වචන මතකයේ රැඳී තිබීමයි. එමෙන්ම ඈ ලස්සන දේට බොහෝ ප්‍රිය කළා.

අපේ සංස්කෘතික අනණ්‍යතාවය රැක රැකගැනීම විශේෂ වැදගත් කමක් ලෙස විශ්වාස කළ ඇය මෙවන් බහු සංස්කෘතික සමාජයක වාසය කරනවිට සිංහලෙන් කතා කිරීම අපට ආවේනික ඇඳුම් ඇඳීම යනාදිය හැකි සෑම අවස්ථාවකම කළ යුතු යයි විශ්වාස කළා. මා සාංවිධානය කළ බොහෝ සංස්කෘතික හා සමාජීය කටයුතු වලදී පටිවර්තනය කිරීම ගායනා වලට සහව වීම නිවේදන කාර්යයන්ට සහය වීම යනාදියෙන් ඇය ලබාදුන් නොමසුරු සහය කෘතඥතාපූර්වකව සඳහන් කරමි. ඇගේ අති විශේෂ ගුණය වන්නේ කිසිදුවිටෙක ඇය අන් අයගේ දොසක් ප්‍රකාශ නොකිරීමයි. සැමවිටම ඇගෙන් ලැබුණේ සිත හිවන ප්‍රතිචාරයක් මයි

මෙල්බන්හි සිංහල ජන සමාජයට නොමැකෙන සේවාවක් කර අපතරින් සමුගත් රමණිට හිවන් සුව.

මාලිනී ජයසිංහ

ගාමිණී ව සම්මානයක්

මෙල්බන් නුවර ලක්හඬ ගුවන්විදුලියේ අධ්‍යක්ෂක ගාමිණී ෆොන්සේකා මහතා ට ජනමාධ්‍ය හා සමාජසේ-වා වෙනුවෙන් විශිෂ්ඨ සම්මානය පසුගිය දා වික්ටෝරියානු අණ්ඩුකාර මහාචාර්ය ඩේවිඩ් ඩි ක්‍රෙස්ටර් මහතා (Prof David de Kretser) විසින් පිළිගත්වනු ලැබූ අවස්ථාව